සැ. යු.- (i) 2020.10.16 දින අංක 2,198 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවිය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2020 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.
(iii) 2020.10.20 වැනි අඟහරුවාද දින අංක 2198/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* "ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිණිස මහජන අදහස් ලබා ගැනීමට කරනු ලබන ආරාධනය" පිළිබඳ අධිකරණ අමාත්‍යාංශය පළකරන ලද නිවේදනය පළ විය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,199 - 2020 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2020.10.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 634 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


සැ. යු.- (i) විසර්ජන (2020) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.
(ii) විසර්ජන (2021) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) සාක්ෂි (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 නොවැම්බර් මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

ලංකා ඔරික්ස් කම්පැණි පීඑල්සී,
(*කලින්* : ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි ලිමිටඩ් යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)
අංක 100/1-1/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
(සමාගමේ නව අංකය : PQ 70)

*නඩු අංකය* : HC (සිවිල්) 128/10
*ඇස්කීසි අංකය* : 18/2020

..............................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. අධිකාරි මුදියන්සේලාගේ ධර්මලතා විජේරත්න මැණිකේ,
174/8, ශාලිකා උද්‍යානය,
මීරිගම පාර, වේවැල්දෙනිය.

*01 වන විත්තිකරුගේ නව ලිපිනය :*

මීරිගම, හල්පේ,
කිරිපට්ටිය හන්දිය.

02. වීරරත්නගේ ජයසිංහ,
174/8, ශාලිකා උද්‍යානය,
මීරිගම පාර, වේවැල්දෙනිය.

03. මානවසිංහ දිසානායකගේ රත්නසිරි මානවසිංහ,
එල්. 37, නාරංගස්තැන්න,
ගලපිටමඩ.

...............................*විත්තිකරුවන්.*

වර්ෂ 2010 ක් වූ නොවැම්බර් මස 08 වැනි දින මෙම නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී 01 වන, 02 වන සහ 03 වන විත්තිකරුවන්ගෙන් එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට අයකර ගන්නට කියා නියම කළ රුපියල් 4,308,089/-ක මුදලක් සහ රුපියල් 4,286,359/- ක මුදලක් මත 2009.09.27 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් මසකට 4% බැගින් පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය සහ නඩු ගාස්තු අය කර ගැනීම සඳහා ද, පළවෙනි විත්තිකරු විසින් පැමිණිලිකරුට මෙම අධිකරණයේ නිලධාරියෙකු තක්සේරු කරන ලද නඩු ගාස්තු අය කර ගැනීම සඳහා ද, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් වන විත්තිකාරිය වන අධිකාරි මුදියන්සේලාගේ ධර්මලතා විජේරත්න මැණිකේ යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදළ සැම සියලු දේ කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2020ක් වූ ජූනි මස 24 වැනි දින කර ඇති තහනමට යටත්ව,

වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 24 වැනි දින පෙ. ව. 11.00 ට 01 වන විත්තිකරුට අයත් මෙම දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වේවැල්දෙණිය ගම තිබෙන මුල්ලදෙනියවත්ත නැමති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල පිහිටීම.*- මෙම ඉඩම නුවර පාරේ වේවැල්දෙණිය හන්දියට පෙර ඇති ඉන්ධන පිරවුම්හලට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) ක් ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට (අ) අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලු වියදම් මුදලින් ගෙවිය යුතු ය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල් විකුණුම් දින සිට දින 30ක් ඇතුලත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ උඩුගහපත්තුවේ වේවැල්දෙනිය ගම තිබෙන දෙල්ගහවත්ත *නොහොත්* මුල්ලදෙනිය වත්ත කැබලි අංක 08 දරන කොටස පර්චස් දහයයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 10.50) විශාලත්වයට

ඩබ්ලිව් ඒ. ගුණතිලක බලයලත් මානක තැනගේ අංක 1967 ඒ සහ 2003.07.27 දිනැති පිඹුර අනුව මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන් වන මායිම ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 7 දරන කොටස ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 13 දරන කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 9 දරන කොටස ද යන මායිම් තුළ සම්පූර්ණ ඉඩම සහ එහි තුළ පිහිටි සියල්ලය.

ආර්. කේ. ගාමිණී වීරසිරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය - කොළඹ

වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 18 වැනි දින දී ය.

10-763